// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2116/70 - 2019 මාර්තු මස 29 වැනි සිකුරාදා - 2019.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: 3/3/6/2/16.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශතාව* ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කටුදෙණිය සායන මධ්‍යස්ථානය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්/පරවශතාවේ * විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ උඩසියපත්තුව සුළු කොට්ඨාසයේ, කටුදෙණිය (ඊ 354 ඒ) ග්‍රාම නිලධාරී වසමේ, කටුදෙණිය නමැති ගමේ පිහිටි, මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මු.පි.මා. 1763 දරන පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0441 ක් වූ කැබලි අංක 01 සහ 02 දරන ඉඩම්.

1\. කැබලි අංකය 01
හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: – ; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0017.

2\. කැබලි අංකය 02
හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; මුල් හිමිකම් කියන අය: – ; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0424.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් 2019 ජූලි මස 24 වැනි දින පෙ.ව. 10.00ට උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019 ජූලි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඊ. ඩබ්ලිව්. එන්. ඒ. එගොඩවෙල,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-476

1A - G 29780 - 27 (2019/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: 3/3/6/2/28-ii

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව* ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ පන්සලාතැන්න ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්/පරවශතාවේ * විස්තරය:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොන්සියපත්තුව සුළු කොට්ඨාසයේ, හලංගොඩ ග්‍රාම නිලධාරි වසමේ, පන්සලාතැන්න නමැති ගමේ පිහිටි, මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මු.පි.මා. 1728 දරන පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1012ක් වූ කැබලි.

**1. කැබලි අංකය 01**

හිමිකම් කියන්නා: ඇල්කඩුව වැවිලි සමාගම, අංක 320, ටී. බී. ජයා මාවත, කොළඹ 10; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.1012.

ඉහත සඳහන් ඩමට/පරවශතාවයට*ඉ හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ජුනි මස 29 වැනි දින පෙ.ව. 9.30ට උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019 ජුනි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඊ. ඩබ්ලිව්. එන්. ඒ. එගොඩවෙල,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 477

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.